# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 666/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 18/04/2024

පැය 1210

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01.** **2024.04.17 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 11 | - | බූලි 01 යි |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු හා දේපල අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **වෙඩි තබා පුද්ගලයින් දෙදෙනෙකු ඝාතනය කිරීමකට ආධාර අනුබල ලබාදුන් සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මෙහෙයුම් ඒකකය .**

පොලිස් විශේෂ කාර්ය බලකා මෙහෙයුම් ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත 2024.04.17 වන දින දහවල් කාලයේ බොරලැස්ගමුව පොලිස් වසමේ රත්නපිටිය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **2024.03.11 වන දින පිටිගල පොලිස් වසමේ හොරංගල්ල නියාගම ප්‍රදේශයේදී වෙඩි තබා පුද්ගලයින් දෙදෙනෙකු ඝාතනය කිරීමට ආධාර අනුබල දීම සම්බන්ධයෙන්** සැකකරුවන් තිදෙනෙකු අත් අඩංගුවට ගෙන පිටිගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු **22 , 24 සහ 31** යන වයස් වල පසුවන **කහදූව , දකුණු උණන්පිටිය හා තවලම යන ප්‍රදේශ වල පදිංචි කරුවන් වේ.** පිටිගල පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුර.**

2024.04.17 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර කේරල ගංජා ග්‍රෑම් 100 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 31 ක් වූ මොරටුව ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර පටවමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර.**

2024.04.17 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වාලච්චේන පොලිස් වසමේ ආලංකුලම් ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ට්‍රැක්ටර් රථයකට පටවමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාලච්චේන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 30 ක් වූ නාවල්ලඩි ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. වාලච්චේන පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. මෙරට නිශ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුර.**

2024.04.17 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අක්කරපත්තුව පොලිස් වසමේ මුහාමිකඩේ ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව මෙරට නිශ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අක්කරපත්තුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 33 ක් වූ අලිගම්බේ ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. අක්කරපත්තුව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. බලපලත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් වැලි ප්‍රවාහනය කරන ලද සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර.**

2024.04.17 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පුදුකුඩිඉරුප්පු පොලිස් වසමේ නාවේලු ආරු ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු ට්‍රැක්ටර් රථයද සමගින් අත්අඩංගුවට ගෙන පුදුකුඩිඉරුප්පු පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 24 ක් වූ ඔඩ්ඩුසුඩාන්** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පුදුකුඩිඉරුප්පු පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**07. අනවසරයෙන් රක්ෂිතයකට ඇතුල් වී කැලය එළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර.**

2024.04.17 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වාකරේ පොලිස් වසමේ කට්ටමුරු මාර්ගයේ 01 කණුව ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර අනවසරයෙන් කදිරවේලි රක්ෂිතයට ඇතුළු වී ලෝඩර් රථයක් යොදාගෙන කැලය අක්කරයක පමණ භූමි ප්‍රමාණයක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාලච්චේන අධිවි වන කාර්යාලය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 26 ක් වූ කන්නන්කුඩා** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**